# 9. සම්මාදිට්ඨි සූත්‍රය

1. මා විසින් මෙසේ අසන ලදී. එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවර සමීපයෙහි අනාථපිණ්ඩික සිටුහු කරවන ලද ජේතවන නම් විහාරයෙහි වැඩ වාසය කරති. එකල්හි ආයුෂ්මත් සාරිපුත්‍ර ස්ථවිරයන් වහන්සේ .ඇවැත්නි. කියා භික්ෂූන්ට කථා කළහ. ඒ භික්ෂූහු .ඇවැත්නි.යි කියා ආයුෂ්මත් සාරිපුත්‍ර ස්ථවිරයන් වහන්සේට උත්තර දුන්හ. ආයුෂ්මත් සාරිපුත්‍ර ස්ථවිරයන් වහන්සේ මෙය වදාළේය.

2. ඇවැත්නි, සම්‍යක්දෘෂ්ටිය, සම්‍යක් දෘෂ්ටිය (හරි දැකීම) යයි කියනු ලැබේ. ඇවැත්නි, ආර්‍ය්‍ය ශ්‍රාවකතෙම කොපමණකින් සම්‍යක් දෘෂ්ටි ඇත්තේ වේද? දෘෂ්ටිය ඍජු බවට පැමිණියාවේද, ධර්‍මයෙහි නොසෙල්වෙන ප්‍රසාදයෙන් යුක්තවූයේ මේ ධර්‍මයට (නිර්‍වාණධර්‍මයට) පැමිණියේ වේද? ඇවැත්නි, අපි ආයුෂ්මත් සාරිපුත්‍ර ස්ථවිරයන් වහන්සේගෙන් මේ කීමෙහි අර්‍ථය දැන ගන්ට දුරසිටත් එන්නෙමු. ආයුෂ්මත් සාරිපුත්‍ර ස්ථවිරයන් වහන්සේටම මේ කීමෙහි අර්‍ථය ප්‍රකාශකිරීම අයත් වේවා, ආයුෂ්මත් සාරිපුත්‍ර ස්ථවිරයන් වහන්සේගෙන් අසා භික්ෂූහු දැනගන්නාහුය. .ඇවැත්නි, එසේවී නම් අසව්, හොඳින් හිතේ තබාගනිව්, කියන්නෙමි. එසේය ඇවැත්නි, කියා ඒ භික්ෂූහු ආයුෂ්මත් සාරිපුත්‍ර ස්ථවිරයන් වහන්සේට උත්තර දුන්හ. ආයුෂ්මත් සාරිපුත්‍ර ස්ථවිරයන් වහන්සේ මෙය වදාළහ.

3. ඇවැත්නි, යම් තැනක පටන් ආර්‍ය්‍ය ශ්‍රාවකතෙම අකුසලයත් දනීද අකුසලමූලයත් දනීද කුසලයත් දනීද කුසලමූලයත් දනීද ඇවැත්නි, මෙපමණකින්ද ආර්‍ය්‍ය ශ්‍රාවකතෙම සම්‍යක් දෘෂ්ටි ඇත්තේ වෙයි. ඔහුගේ දෘෂ්ටිය ඍජු බවට ගියා වෙයි. ධර්මයෙහි නොසෙල්වෙන ප්‍රසාදයෙන් යුක්තවූයේ මේ (නිර්‍වාණ) ධර්‍මයට පැමිණියේ වෙයි. ඇවැත්නි, අකුසලය කවරේද? අකුසලමූලය කවරේද? කුසලය කවරේද? කුසලමූලය කවරේද? ඇවැත්නි, ප්‍රාණඝාතය අකුසල්ය, සොරකම් කිරීම අකුසල්ය, කාමයන්හි වරදවා හැසිරීම අකුසල්ය, බොරුකීම අකුසල්ය, කේලාම් කීම අකුසල්ය, ඵරුෂවචන කීම අකුසල්ය, නිෂ්ඵල කථා කීම අකුසල්ය, අධික ලොභය අකුසල්ය, බලවත් ක්‍රොධය අකුසල්ය, වැරදි දෘෂ්ටිය අකුසල්ය, ඇවැත්නි, මේ අකුසලයයි කියනු ලැබේ.

ඇවැත්නි, අකුසලමූලය කවරේද? ලොභය අකුසල් මූලයි, ද්වේෂය අකුසල් මූලයි, මොහය අකුසල් මූලයි, ඇවැත්නි, අකුසල් මූල්යයි කියනු ලැබේ.

ඇවැත්නි, කුසලය කවරේද? ප්‍රාණඝාතයෙන් වැළැක්ම කුසල්ය, සොරකම් කිරීමෙන් වැළැක්ම කුසල්ය, කාමයෙහි වරදවා හැසිරීමෙන් වැළැක්ම කුසල්ය, බොරු කීමෙන් වෙන්වීම කුසල්ය, කේලාම් කීමෙන් වෙන්වීම කුසල්ය,

ඵරුෂ වචනයෙන් වෙන්වීම කුසල්ය, හිස් වචනයෙන් වෙන්වීම කුසල්ය, අධික ලොභය නැති බව කුසල්ය, ව්‍යාපාද නැති බව කුසල්ය, නිවැරදි දැකීම කුසල්ය. ඇවැත්නි, මේ කුසලයයි කියනු ලැබේ.

4. ඇවැත්නි, කුසල මුල් කවරේද? අලොභය කුසල් මුලයි, අද්වේෂය කුසල් මුලයි, අමොහය කුසල් මුලයි. ඇවැත්නි, මේ කුසල මුල්යයි කියනු ලැබේ.

ඇවැත්නි, යම්තැනක පටන් ආර්‍ය්‍යශ්‍රාවකතෙම මෙසේ අකුසලය දනීද, අකුසල්මුල් දනීද , කුසලය දනීද , කුසල්මුල් දනීද හෙතෙම සර්‍වප්‍රකාරයෙන් රාගය දුරුකොට ක්‍රොධය දුරුකොට මම වෙමි යන දැකීම හා මානය නසා අවිද්‍යාව දුරුකොට අර්හත් මාර්ග විද්‍යා උපදවා මේ ජාතියෙහිදීම දුක් කෙළවර කරන්නේ වෙයි.

ඇවැත්නි, මෙපමණකින්ද ආර්‍ය්‍ය ශ්‍රාවකතෙම සම්‍යක් දෘෂ්ටි ඇත්තේ වෙයි. ඔහුගේ දෘෂ්ටිය ඍජු බවට පැමිණියා වෙයි. ධර්මයෙහි නොසෙල්වෙන ප්‍රසාදයෙන් යුක්තවූයේ මේ (නිර්‍වාණ) ධර්‍මයට පැමිණියේ වෙයි.

ඇවැත්නි, ඉතා මැනවයි කියා ඒ භික්ෂූහු ආයුෂ්මත් සාරිපුත්‍ර ස්ථවිරයන් වහන්සේගේ වචනය සතුටින් පිළිගෙන ආයුෂ්මත් සාරිපුත්‍ර ස්ථවිරයන් වහන්සේගෙන් තවත් ප්‍රශ්නයක් ඇසුවාහුය.

5. ඇවැත්නි, යම් ක්‍රමයකින් ආර්‍ය්‍ය ශ්‍රාවකතෙම සම්‍යක්දෘෂ්ටි ඇත්තේ වෙයිද, දෘෂ්ටිය ඍජුබවට පැමිණියා වෙයිද, ධර්මයෙහි නොසෙල්වෙන ප්‍රසාදයෙන් යුක්තවූයේ මේ (නිර්‍වාණ) ධර්‍මයට පැමිණියේ වෙයිද, එබඳුවූ වෙනත් ක්‍රමයකුත් ඇත්තේද?

ඇවැත්නි, ඇත්තේය, යම් තැනක පටන් ආර්‍ය්‍ය ශ්‍රාවකතෙම ආහාරය දනීද, ආහාරයාගේ හේතුව දනීද? ආහාරයාගේ නැතිකිරීම දනීද, ආහාර නැතිකිරීමට පමුණුවන ප්‍රතිපදාව දනීද මෙපමණකින්ද ආර්‍ය්‍ය ශ්‍රාවකතෙම සම්‍යක්දෘෂ්ටි ඇත්තේ වෙයි . ඔහුගේ දෘෂ්ටිය ඍජු බවට පැමිණියා වෙයි. ධර්මයෙහි නොසෙල්වෙන ප්‍රසාදයෙන් යුක්තවූයේ මේ (නිර්‍වාණ) ධර්‍මයට පැමිණියේ වෙයි.

6. ඇවැත්නි , ආහාරය කවරේද? ආහාරයාගේ හේතුව කවරේද? ආහාරයාගේ නැතිකිරීම කවරේද? ආහාර නැති කිරීමේ ප්‍රතිපදාව කවරේද? ඇවැත්නි, සත්ත්වයන්ගේ පැවැත්ම පිණිසද, සත්ත්වයන්ට අනුග්‍රහ පිණිසද පවත්නාවූ ආහාර සතරක් වෙත්. කවර සතරක්ද යත්? ඝනවූද සියුම්වූද කබලිංකාර ආහාරය (කන බොන ආහාරය) ද, දෙවෙනිවූ ස්පර්‍ශ ආහාරය (විඳීමට හේතු වන්නාවූ සිතත් අරමුණත් ගැටීම)ද, තුන්වැනිවූ මනොසංචෙතනා ආහාරය (උත්පත්තියට

හෙතුවන කර්‍මයද, සතරවැනිවූ විඤ්ඤාණ ආහාරය (නාම රූපයන්ගේ පැවැත්මට හෙතුවූ විඤ්ඤාණය)ද යන සතරය.

තෘෂ්ණාවගේ හටගැන්ම නිසා ආහාරයාගේ හටගැන්ම වේ. තෘෂ්ණාව නැතිකිරීමෙන් ආහාරයාගේ නැතිකිරීම වෙයි. මේ ආර්‍ය්‍ය අෂ්ටාංගික මාර්‍ගයම ආහාර නැති කිරීමට පමුණුවන ප්‍රතිපදාවයි. එනම් නිවැරදි දැකීම, නිවැරදි කල්පනාව, නිවැරදි වචනය, නිවැරදි කර්‍මාන්තය, නිවැරදි ක්‍රියාව, නිවැරදි ව්‍යායාමය, නිවැරදි සිහිය, නිවැරදි සමාධිය යන මේයි. ඇවැත්නි, යම් තැනක පටන් ආර්‍ය්‍ය ශ්‍රාවකතෙම ආහාරය දනීද, ආහාරයාගේ හේතුව දනීද? ආහාරයාගේ නැතිකිරීම දනීද, ආහාර නැතිකිරීමට යන ප්‍රතිපදාව දනීද හෙතෙම සර්‍වප්‍රකාරයෙන් රාගය දුරුකොට මම වෙමියි යන දෘෂ්ටිය හා මානය නසා අවිද්‍යාව දුරුකොට අර්හත් මාර්‍ගඥාන විද්‍යාව උපදවා මේ ආත්මයෙහිම දුක් කෙළවර කරන්නේ වෙයි. ඇවැත්නි, මෙපමණකින්ද ආර්‍ය්‍ය ශ්‍රාවකතෙම සම්‍යක්දෘෂ්ටි ඇත්තේ වෙයි. ඔහුගේ දෘෂ්ටිය ඍජු බවට පැමිණියා වෙයි . ධර්මයෙහි නොසෙල්වෙන ප්‍රසාදයෙන් යුක්තවූයේ මේ (නිර්‍වාණ) ධර්‍මයට පැමිණියේ වෙයි.

ඇවැත්නි, ඉතා මැනවයි කියා ඒ භික්ෂූහු ආයුෂ්මත් ශාරිපුත්‍ර ස්ථවිරයන්වහන්සේගේ (වචනය) සතුටින් පිළිගෙන ආයුෂ්මත් ශාරිපුත්‍ර ස්ථවිරයන්වහන්සේගෙන් තවත් ප්‍රශ්නයක් ඇසුවාහුය.

7. ඇවැත්නි, යම් ක්‍රමයකින් ආර්‍ය්‍ය ශ්‍රාවකතෙම සම්‍යක්දෘෂ්ටි ඇත්තේ වෙයිද, දෘෂ්ටිය ඍජුබවට පැමිණියා වෙයිද, ධර්මයෙහි නොසෙල්වෙන ප්‍රසාදයෙන් යුක්තවූයේ මේ (නිර්‍වාණ) ධර්‍මයට පැමිණියේ වෙයිද, එබඳුවූ වෙනත් ක්‍රමයකුත් ඇත්තේද? ඇවැත්නි, ඇත්තේය. ඇවැත්නි, යම් තැනක පටන් ආර්‍ය්‍ය ශ්‍රාවකතෙම දුක දනීද, දුක ඉපදීමට හේතුව දනීද, දුක නැතිකිරීම දනීද, දුක නැතිකිරීමට යන මාර්‍ගය දනීද, මෙපමණකින්ද ඇවැත්නි, ආර්‍ය්‍ය ශ්‍රාවකතෙම සම්‍යක්දෘෂ්ටි ඇත්තේ වෙයි . ඔහුගේ දෘෂ්ටිය ඍජු බවට පැමිණියා වෙයි . ධර්මයෙහි නොසෙල්වෙන ප්‍රසාදයෙන් යුක්තවූයේ මේ (නිර්‍වාණ) ධර්‍මයට පැමිණියේ වෙයි. ඇවැත්නි, දුක කවරේද? දුක් හට ගැන්මට හේතුව කවරේද? දුක නැතිකිරීම කවරේද? දුක් නැති කිරීමට යන ප්‍රතිපදාව කවරේද යත්? ඉපදීමද දුකය, දිරීමද දුකය, මරණයද දුකය, ශොකය, වැළපීමය, ශාරීරික දුකය, මානසික දුකය, දැඩි වෙහෙසය යන මොහුද දුකය කැමතිවන යමක් නොලැබේ නම් ඒද දුකය. කොටින්ම උපාදානස්කන්ධ පහම දුකය. ඇවැත්නි, මේ දුකයයි කියනු ලැබේ.

8. ඇවැත්නි, දුක් හටගැන්මට හේතුව කවරේද? නැවත නැවත ඉපදීම ඇති කරන්නාවූ බලවත් තෘෂ්ණාව හා එක්ව පවත්නාවූ ඒ ඒ තැන ඇලෙන්නාවූ යම් මේ තෘෂ්ණාවක් වේද, එනම් කාම තෘෂ්ණාවය(වස්තුකාම ආශාව), භව තෘෂ්ණාව (ශාස්වත දෘෂ්ටිය හා යෙදුණ ආශාව), විභව තෘෂ්ණාව (උච්ඡේද දෘෂ්ටිය හා යෙදුණ ආශාව) යන මොහුය. ඇවැත්නි, මේ දුක් හටගැන්මට හේතුවයයි කියනු ලැබේ. ඇවැත්නි, දුක් නැති කිරීම කවරේද? ඒ තෘෂ්ණාවගේම ඉතිරි නොකොට නැතිකිරීමක් වේද, දුරලීමක්, මිදීමක්, ආලය නොකිරීමක් වේද, ඇවැත්නි, මේ දුක නැතිකිරීම යයි කියනු ලැබේ.

9. ඇවැත්නි, දුක් නැතිකිරීමට යන ප්‍රතිපදාව කවරේද? මේ ආර්‍ය්‍ය අෂ්ටාංගික මාර්‍ගයයි. එනම් නිවැරදි දැකීම, නිවැරදි කල්පනාව, නිවැරදි වචනය, නිවැරදි කර්මාන්තය , නිවැරදි ජීවිකාව, නිවැරදි ව්‍යායාමය, නිවැරදි සිහිය, නිවැරදි සමාධිය යන මොහුයි. ඇවැත්නි, යම්තැනක පටන් ආර්‍ය්‍ය ශ්‍රාවකතෙම මෙසේ දුක දනීද, මෙසේ දුක් ඉපදීමට හේතුව දනීද, මෙසේ දුක් නැතිකිරීම දනීද, මෙසේ දුක් නැතිකිරීමට මාර්ගය දනීද, හෙතෙම සර්‍වප්‍රකාරයෙන් රාගය දුරුකොට ද්වෙෂය දුරුකොට මම වෙමි යන දෘෂ්ටිය හා මානය නසා අවිද්‍යාව දුරුකොට අර්හත් මාර්‍ගඥාන විද්‍යාව උපදවා මේ ආත්මයෙහිම දුක් කෙළවර කරන්නේ වෙයි. ඇවැත්නි, මෙපණකින්ද ආර්‍ය්‍ය ශ්‍රාවකතෙම සම්‍යක්දෘෂ්ටි ඇත්තේද වෙයි. ඔහුගේ දෘෂ්ටිය ඍජුබවට පැමිණියාද වෙයි. ධර්‍මයෙහි නොසෙල්වෙන ප්‍රසාදයෙන් යුක්තවූයේ මේ (නිර්‍වාණ) ධර්‍මයෙහි පැමිණියේ වෙයි.

ඇවැත්නි, මැනැවයි කියා ඒ භික්‍ෂූහු ආයුෂ්මත් ශාරිපුත්‍ර ස්ථවිරයන්වහන්සේගේ වචනය සතුටින් පිළිගෙන ආයුෂ්මත් ශාරිපුත්‍ර ස්ථවිරයන්වහන්සේගෙන් ඊළඟ ප්‍රශ්නය විචාළාහුය.

10. ඇවැත්නි , ආර්‍ය්‍යශ්‍රාවකතෙම යම්සේ සම්‍යක්දෘෂ්ටි ඇත්තේ වෙයිද, ඔහුගේ දෘෂ්ටිය ඍජුබවට පැමිණියා වෙයිද, ධර්‍මයෙහි නොසෙල්වෙන ප්‍රසාදයෙන් යුක්තවූයේ මේ (නිර්‍වාණ) ධර්‍මයෙහි පැමිණියේ වෙයිද, එබඳුවූ අනික් ක්‍රමයක් ඇත්තේද? ඇවැත්නි, ඇත්තේය.

ඇවත්නි, ආය්‍ර්‍ය ශ්‍රාවකතෙම යම් සේ සම්‍යක්දෘෂ්ටි ඇත්තේ වෙයිද, ඔහුගේ දෘෂ්ටිය ඍජුබවට පැමිනියා වෙයිද, ධර්‍මයෙහි නොසෙල්වෙන ප්‍රසාදයෙන් යුක්තවූයේ මේ (නිර්‍වාණ)ධර්‍මයට පැමිණියේ වෙයිද, එබඳු අනික් ක්‍රමයක් ඇත්තේද? ඇවත්නි, ඇත්තේය. ආර්‍ය්‍ය ඇවැත්නි, ආර්‍ය්‍ය ශ්‍රාවකතෙම යම් තැනක පටන් ජරා මරණ දෙක දනිද, ජරා මරණයන්ගෙන් හෙතුව දනිද, ජරා මරණයන්ගේ නැතිකිරීම දනිද, මෙපමනකින්ද, ආර්‍ය්‍යශ්‍රාවකතෙම සම්‍යක්දෘෂ්ටි ඇත්තේ වෙයි. ඔහුගේ දෘෂ්ටිය ඍජුබවට පැමිණියා වෙයි.ධර්මයෙහි නොසෙල්වෙන ප්‍රසාද යෙන් යුක්තවූයේ මේ (නිර්‍වාණ) ධර්‍මයට පැමිණියේ වෙයි.

11. "ඇවැත්නි ජරා මරණය කවරේද? ජරාමරණයට හෙතුව කවරේද? ජරා මරණයනැති කිරීම කවරේද? ජරාමරණ නැති කිරීමට යන ප්‍රතිපදව කවරේද? ඒ ඒ සත්ත්ව වර්‍ගයෙහි ඒ ඒ සත්ත්වයන්ගේ යම් (දිරිවක්) දිරායන බවක් වේද, දත් ආදිය කැඩී යාමක් වේද, ඉසකේ ආදිය පැසීමක් වේද, රැලිවැටුණු සම් ඇති බවක් වේද, ආයුෂයාගේ පිරිහීමක් වේද ඇස් ආදි ඉන්ද්‍රියන්ගේ මේරීමක් වේද, ඇවත්නි, මේ ජරාවයයි කියනු ලැබේ. ඇවැත්නි, මරණය කවරේද, ඒ ඒ සත්ත්වයන්ගේ ඒ ඒ සත්ත්ව වර්‍ගයෙන් යම් චුත වීමක් වේද, අතුරුදහන් වීමක් වේද, මරණයක් වේද, කාලකියාවක් වේද, පංචස්කන්ධයන්ගේ බිඳීමක් වේද, ශරිරය බැහැර දැම්මක් වේද? ඇවැත්නි මරණයයි කියනු ලැබේ. ඇවත්නි

මෙසේ මේ ජරාවද, මේ මරණයද යන දෙක ජරාමරණයයි කියනු ලැබේ. ජාතිය (ඉපදීම) ඇතිවීමෙන් ජරා මරණයන්ගේ ඇත්වීම වේ. ජාතිය නැති කිරීමෙන් ජරාමරණයන්ගේ නැති වීම

වේ. ආර්‍ය්‍ය අෂ්ටාංගික මාර්ගයම ජරා මරණයන් නැතිකිරීමට යන ප්‍රතිපදායි. එනම් නිවැරදි දැකීම, නිවැරදි කල්පනාව, නිවැරදි වචනය, නිවැරදි කර්මාන්තය, නිවැරදි ජීවිකාව, නිවැරදි ව්‍යායාමය, නිවැරදි සිහිය, නිවැරදි සමාධිය, යන මේයි.

**12.** ඇවත්නි, යම් තැනක පටන් ආර්‍ය්‍ය ශ්‍රාවක තෙම මෙසේ ජරාව හා මරණය දනිද,මෙසේ ජරා මරනයන්ගේ හට ගැන්ම දනිද, මෙසේ ජරා මරණයන්ගේ නැති කිරීම දනිද, මෙසේ ජරා මරනයන්ගේ නැති කිරීම දනිද, මෙසේ ජරා මරනයන් නැතිකිරීමට පමුණුවන ප්‍රතිපදාව දනිද, හෙතෙම සර්වප්‍රකාරයෙන් රාගය දුරු කොටද්වේෂය දුරු කොට මම වෙමිය යන දෘෂ්ටිය හා මානය නිසා අවිද්‍යාව දුරු කොට අරහත් මාර්ගඥාන විද්‍යාව උපදවා මේ ආත්මයෙහිම දුක් කෙලවර කරන්නේ වෙයි. ඇවත්නි මෙපමණකින්ද, ආර්‍ය්‍ය ශ්‍රාවක තෙම සම්‍යක් දෘෂ්ටිවෙයි. ඔහුගේ දෘෂ්ටිය ඍජු බවට පැමිණියා වෙයිද, ධර්මයෙහි නොසෙල්වෙනප්‍රසාදයෙන් යුක්ත වූයේ මේ (නිර්වාණ) ධර්මයට ආයේ වෙයි.

"ඇවත්නි ඉතා මැනවැයි කියා ඒ භික්ෂූහු ආයුෂ්මත් ශාරිපුත්‍ර ස්ථවිරයන් වහන්සේ වචනය සතුටින් පිලිගෙන ආයුෂ්මත් ශාරිපුත්‍ර ස්ථවිරයන් වහන්සේගේ ඉලග ප්‍රශ්නය ඇසුවාය. ඇවත්නි යම් ක්‍රමයකින් ආර්‍ය්‍ය ශ්‍රාවක තෙම සම්‍යක් දෘෂ්ටියඇත්තේ වෙයිද, ධර්මයෙහි නොසෙල්වෙන් ප්‍රසාදයෙන් යුක්ත වූයේ මේ (නිර්වාණ) ධර්මයට පැමිණියේ වෙයිද, එබදු වූ වෙනත් ක්‍රමයකුත් ඇත්තේද?

**13.** ඒ ඇවැත්නි ඇත්තේය. යම්තැනක පටන් ආර්‍ය්‍ය ශ්‍රාවක තෙම ජාතිය (ඉපදීම ) දනිද ඉපදීමට හේතුව දනිද, ඉපදීම නැති කිරීම දනිද, ඉපදීම නැති කිරීමට යන ප්‍රතිපදාව දනිද, ඇවැත්නි, මෙපණකින් ද ආර්‍ය්‍ය ශ්‍රාවක තෙම සම්‍යක් දෘෂ්ටි ඇත්තේ වෙයි. ඔහුගේ දෘෂ්ටිය ඍජුබවට පැමිණියා වෙයි ධර්මයෙහි නොසෙල්වෙන ප්‍රසාදයෙන් යුක්තවූයේ ධර්මයට පැමිණියේ වෙයි.

ඇවැත්නි, ජාතිය කවරේ ද ඒ ඒ සත්‍වයන්ගේ ඒ ඒ සත්‍ව වර්ගයෙහි යම් ඉපදීමක් වේද, මනා කොට ඉපදීමක් වේද මව් කුසට පැමිණීමක් වේද, ප්‍රකටව ඉපදීමක් වේද, ස්කන්‍ධයන්ගේ පහළ වීමක් වේද, ආයතනයන්ගේ ලැබීමක්වේද, ඇවැත්නි, මේ ජාතියයි කියනු ලැබේ. කර්මභවය හෙතු කොටගෙන ජාතිය ඇතිවේ. කර්මභවය හේතුකොට ගෙන ජාතිය ඇතිවේ. කර්මභවය නැති කිරීමෙන් ජාතය නැති කිරීම වේ. මේ ආය්‍ය අෂ්ටාංගික මාර්ගයම ජාතිය නැතිකිරීමට පමුණුවන ප්‍රතිපදාවයි. එනම්: නිවැරදි දැකීම, නිවැරදි කල්පනාව, නිවැරදි වචනය, නිවැරදි කර්මාන්තය, නිවැරදි ජීවිකාව, නිවැරදි ව්‍යායාමය නිවැරදි සිහිය, නිවැරදි සමාධිය යන මේයි.

ඇවැත්නි, යම් අවස්ථාවක පටන් ආර්‍ය්‍ය ශ්‍රාවක තෙම මෙසේ ජාතිය දනිද, මෙසේ ජාතියට හෙතුව දනිද, මෙසේ ජාතිය නැතිකිරීම දනිද, මෙසේ ජාතිය නැතිකිරීමට යන ප්‍රතිපදාව දනිද, හෙතම ස්ර්වප්‍රකාරයෙන් රාගය දුරුකොට, ක්‍රොධය_දුරුකොට මම වෙමියි යන දෘෂ්ටය හා මානය නසා අවිද්‍යාව දුරුකොට අර්හත් මාර්ග විද්‍යාව උපදවා මේ ආත්මයෙහිම දුක් කෙළවර කරන්නේ වෙයි. ඇවැත්නි, මෙපමණක්ද ආර්‍ය්‍ය ශ්‍රාවක තෙම සම්‍යක්දෘෂ්ටි ඇත්තේ වෙයි. ඔහුගේ

දෘෂ්ටිය ඍජුබවට පැමිණියා වෙයි. ධර්මයෙහි නොසෙල්වෙන ප්‍රසාදයෙන් යුක්ත වූයේ ධර්මයට පැමිණියේ වෙයි.

ඇවැත්නි, මැනවයි කියා ඒ භික්ෂූහු ආයුෂ්මත් ශාරිපුත්‍ර ස්ථවිරයන් වහන්සේගේ වචනය සතුටින් පිළිගෙණ අනුමෝදන්ව ආයුෂ්මත් ශාරිපුත්‍ර ස්ථවිරයන් වහන්සේගේන් ඊළඟ ප්‍රශ්න ඇසූවාහුය,

ඇවැත්නි, යම් ක්‍රමයකින් ආර්‍ය්‍ය ශ්‍රවක තෙම සම්‍යක්දෘෂ්ටි ඇත්තේ වෙයිද, දෘෂ්ටිය ඍජුබවට පැමිණියා වෙයිද, ධර්මයෙහි නොසෙල්වෙන ප්‍රසාදයෙන් යුක්තවූයේ මේ (නිර්වාණ) ධර්මයට පැමිණියේ වෙයිද එබඳුවූ වෙනත් ක්‍රමයකුත් ඇත්තේද?

14. ඇවැත්නි, ඇත්තේය. ඇවැත්නි, යම් තැනක පටන් ආර්‍ය්‍ය ශ්‍රාවකතෙම කර්මභවය දනීද, කර්මභවය ඇතිවීමට හේතුව දනීද, කර්මභවය නැත්කිරීම දනීද, කර්මභවය නැති කිරීමට යන මාර්ගය දනීද, ඇවැත්නි , මෙපමණකින් ආර්‍ය්‍ය ශ්‍රාවකතෙම සම්‍යක්දෘෂ්ටි ඇක්කේ වෙයි. ඔහුගේ දෘෂ්ටිය ඍජු බවට පැමිණියා වෙයි. ධර්මයහි නොසෙල්වෙන ප්‍රසාදයෙන් යුක්ත වූයේ මේ (නිර්වාණ) ධර්මයට පැමිණියේ වෙයි. ඇවැත්නි, භවය කවරේද , භවය ඇතිවීමට හේතුව කවරේද, භවය නැතිකිරීම කවරේද, භවය නැතිකිරීමට යන මාර්ගය කවරේද,ඇවැත්නි භවයෝ (කර්මභව උත්පත්ති භව) මේ තුනක් වෙත්. කාම භවය, රූප භවය, අරූප භවය,(යන තුනයි) උපාදානයන් (තෘෂ්ණාවෙන්දැඩි ලෙස ගැනීම) හේතුකොටගෙන භවයන්ගේ හටගැන්ම වේ. උපාදාන නැතිකිරීම භවයන්ගේ නැතිකිරී වේ. මේ අර්‍ය්‍ය අෂ්ටාංගික මාර්ගය භවය නැතිකිරීමේ මාර්ගය වේ. ඒකවරේද යත්? නිනැරදි දැකීම, නිවැරදි කල්පනාව, නිවැරදි වචනය, නිවැරදි කර්මාන්ත, නිවැරදි ජීවිකාව, නිවැරදි ව්‍යායාමය, නිවැරදි සිහිය, නිවැරදි සමාධිය, යන මේයි.

ඇවැත්නි, යම් තැනක පටන් ආර්‍ය්‍ය ශ්‍රවක තෙම මෙසේ භවය දනීද, මෙසේ භවයාගේ හටගැනීම දනීද , මෙසේ භවය නැතිකිරීම දනීද, භවය නැතිකිරීමට යන ප්‍රතිපදාව දනීද, හෙතෙම සර්වප්‍රකාරයෙන් රාගය දුරුකොට, ක්‍රොධය දුරුකොට, මම වෙමියි යන දෘෂ්ටිය හා මානය නසා අවිද්‍යාව දුරුකොට අරහත් මර්ග වද්‍යාව උපදවා මේ ආත්තමයෙහිම දුක් කෙළවර කරන්නේවෙයි. ඇවැත්නි, මෙපමණකින්ද ආර්‍ය්‍ය ශ්‍රාවක තෙම සම්‍යක්දෘෂ්ටි ඇත්තේ වෙයි. ඔහුගේ දෘෂ්ටිය ඍජුබවට පැමිණියා වෙයි. ධර්මයෙහි නොසෙල්වෙන ප්‍රසාදයෙන් යුක්ත වූයේ මේ (නිර්වාණ) ධර්මයට පැමිණියේ වෙයි.

ඇවැත්නි, ඉතා මැනවයි කියා ඒ භික්ෂූහු ආයුෂ්මත් ශාරිපුත්‍ර ස්ථවිරයන් වහන්සේගේ වචනය සතුටින් පිළිගෙන ආයුෂ්මත් ශාරිපුත්‍ර ස්ථවිරයන් වහන්සේගෙන් ඊළඟ ප්‍රශ්නය ඇසූවාහුය. ඇවැත්නි, යම් ක්‍රමයක්න් ආර්‍ය්‍යශ්‍රාවක තෙම සම්‍යක්දෘෂ්ටි ඇත්තේ වෙයිද, දෘෂ්ටිය ඍජුබවට පැමිණියා වෙයිද, ධර්මයෙහි නොසෙල්වන ප්‍රසාදයෙන් යුක්ත වූයේ මේ (නිර්වාණ) ධර්මයට පැමිණියේ වෙයිද, එබඳුවූ වෙනත් ක්‍රමයකුත් ඇත්තේද?

15. ඇවැත්නි, ඇත්තේය. ඇවැත්නි, යම්තැනක පටන් ආර්‍ය්‍යශ්‍රාවක තෙම උපාදානය (තෘෂ්ණා දෘෂ්ටි දෙකින් දැඩිකොට අල්ලාගැනීම) දනීද, උපාදාන නැතිකිරීමට යන ප්‍රතිපදාව දනීද ඇවැත්නි,

මෙපමණකින්ද ආර්‍ය්‍ය ශ්‍රාවකතෙම සම්‍යක්දෘෂ්ටි ඇත්තේ වෙයි. ඔහුගේ දෘෂ්ටිය ඍජුබවට පැමිණියා වෙයි. ධර්‍මයෙහි නොසෙල්වෙන ප්‍රසාදයෙන් යුක්ත වූයේ ධර්‍මයට පැමිණියේ වෙයි.

ඇවැත්නි, උපාදානය කවරේද? උපාදානයන්ගේ හටගැන්ම කවරේද? උපාදානයන්ගේ නැතිකිරීම උපාදානයන් නැති කිරීමට පුහුණුවන ප්‍රතිපදාව කවරේද? ඇවැත්නි මේ උපාදාන සතරක් වෙත්. කාම උපාදානය ( ආශාවෙන් දැඩිකොට අල්ලාගැනීම) දිට්ඨි උපාදානය ( දෘෂ්ටියෙන් දැඩි කොට අල්ලාගැනීම) අත්තවාද උපාදානය (ආත්මයක් ඇතැයි තරයේ ගැනීම) සීලබ්බත උපාදානය (ශාසනයෙන් පිටත ශීලව්‍රත තරයේ ගැනීම) යන සතරයි.

තෘෂ්ණාව හේතුකොටගෙන උපාදානයන්ගේ හට ගැන්ම වේ. තෘෂ්ණාව නැතිකිරීමෙන් උපාදාන නැති කිරීම වේ. මේ අර්‍ය්‍ය අෂ්ටාංගික මාර්‍ගයම උපාදාන නැතිකිරීමට යන මාර්‍ගයයි. එනම් නිවැරදි දැකීම, නිවැරදි කල්පනාව, නිවැරදි වචනය, නිවැරදි කර්‍මාන්තය, නිවැරදි ජීවිකාව, නිවැරදි ව්‍යායාමය, නිවැරදි සිහිය, නිවැරදි සමාධිය යන මේයි.

ඇවැත්නි, යම් තැනක පටන් ආර්‍ය්‍ය ශ්‍රාවක තෙම උපාදානය දනියිද, උපාදාන හටගැන්ම දනීද උපාදාන නැතිකිරීම දනිද, උපාදානයන් නැතිකිරීමේ ප්‍රතිපදාව දනීද, හෙතෙම සර්‍වප්‍රකාරයෙන් රාගය දුරුකොට, ක්‍රොධය දුරුකොට මම වෙමියි යන දෘෂ්ටිය හා මානය නසා අවිද්‍යාව දුරුකොට අර්හත් මාර්‍ග විද්‍යාව උපදවා මේ ආත්මයෙහිම දුක් කෙළවර කරන්නේ වෙයි. ඇවැත්නි මෙපමණකින්ද ආර්‍ය්‍යශ්‍රාවක තෙම සම්‍යක්දෘෂ්ටි ඇත්තේවෙයි. ඔහුගේ දෘෂ්ටිය ඍජුබවට පැමිණියා වෙයි. මේ (නිර්‍වාණ ) ධර්‍මයට පැමිණියේ වෙයි.

ඇවැත්නි, මැනවැයි කියා ඒ භික්ෂුහු ආයුෂ්මත් ශාරිපුත්‍ර ස්ථවිරයන්වහන්සේගේ වචනය සතුටින් පිළිගෙන ආයුෂ්මත් ශාරිපුත්‍රස්ථවිරයන්වහන්සේගෙන් ඊළඟ ප්‍රශ්නය ඇසුවාහුය. ඇවැත්නි යම් ක්‍රමයකින් අර්‍ය්‍ය ශ්‍රාවක තෙම සම්‍යක්දෘෂ්ටි ඇත්තේ වෙයිද, ඔහුගේ දෘෂ්ටිය ඍජුබවට පරමිණියා වෙයිද, ධර්‍මයෙහිනොසෙල්වෙන ප්‍රසාදයෙන් යුක්ත වූයේ මේ (නිර්‍වාණ) ධර්‍මයට පැමිණියේ වෙයිද එබඳුවූවෙනත් ක්‍රමයකුත් ඇත්තේද?

16. ඇවැත්නි, ඇත්තේය. යම්.තැනකපටන් ආර්‍ය්‍ය ශ්‍රාවක නෙතම තණ්හාව දනීද , තණ්හාව ඉපදීමට හේතුව දනීද, තණ්හාව නැතිකිරීම දනීද, තණ්හාව නැතිකිරීමට යන මාර්‍ගය දනීද, ඇවැත්නි මෙපමණකින්ද, ආර්‍ය්‍යශ්‍රාවක තෙම සම්‍යක්දෘෂ්ටි ඇත්තේ වෙයි.

ඔහුගේ දෘෂ්ටිය ඍජුබවට පැමිණියා වෙයි. ධර්‍මයෙහි නොසෙල්වෙන ප්‍රසාදයෙන් යුක්ත වූයේ මේ (නිර්‍වාණ) ධර්‍මයට පැමිණියේ වෙයි.

ඇවැත්නි, තණ්හාව කවරේද? තණ්හාව හටගැන්මට හේතු කවරේද? තණ්හාව නැතිකිරීම කවරේද? තණ්හාව නැතිකිරීමට යන මාර්‍ගය කවරේද?

ඇවැත්නි, මේ තණ්හාව කොටස් සයක් වෙත්. රූපතණ්හාව, සද්දා තණ්හාව, ගන්ධ තණ්හාව, රස තණ්හාව, වය පොට්ඨබ්බ තණ්හාවය, ධම්ම තණ්හාව(යන සයයි)

වේදනාවගේ හටගැන්මෙන් තණ්හාවගේ හටගැන්මවේ. වේදනාව නැතිකිරීමෙන් තණ්හාව නැතිකිරීම වේ. මේ ආර්‍ය්‍ය අෂ්ටාංගික මාර්ගයම තණ්හාව නැතිකිරීමට පමුණුවන ප්‍රතිපදාවයි. එනම් නිවැරදි දැකීම, නිවැරදි කල්පනාව, නිවැරදි වචනය, නිවැරදි කර්මාන්තය, නිවැරදි ජීවිකාව, නිවැරදි ව්‍යායාමය, නිවැරදි සිහිය, නිවැරදි සමාධිය යන මේයි.

ඇවැත්නි, යම් තැනක පටන් ආර්‍ය්‍යශ්‍රාවක තෙම මෙසේ තණ්හාව දනීද, මෙසේ තණ්හාව හටගැන්ම දනීද, මෙසේ තණ්හාව නැතිකිරීම දනීද, මෙසේ තණ්හාව නැතිකිරීමට යන ප්‍රතිපදාව දනීද, හෙම සර්වප්‍රකාරයෙන් රාගය දුරු කොට, ක්‍රොධය දුරුකොට, මම වෙමියි යන දෘෂ්ටිය හා මානය නසා අවිද්‍යාව දුරුකොට අර්හත් මාර්ගවිද්‍යාව උපදවාමේ ආත්මයේම දුක් කෙළවර කරන්නේ වෙයි. ඇවැත්නි, මෙපමණකින්ද ආර්‍ය්‍යශ්‍රාවක තෙම සම්‍යක් දෘෂ්ටිඇත්තේ වෙයි. ඔහුගේදෘෂ්ටිය ඍජුබවට පැමිණියා වෙයි. ධර්මයෙහි නොසෙල්වෙන ප්‍රසාදයෙන් යුක්තවූයේ (නිර්වාණ)ධර්මයට පැමිණියේ වෙයි.

ඇවැත්නි, මැනවයි කියා ඒ භික්ෂූහු ආයුෂ්මත් ශාරිපුත්‍ර ස්ථවිරයන් වහන්සේගේ වචනය සතුටින් පිළිගෙන ආයුෂ්මත් ශාරිපුත්‍ර ස්ථවිරයන්වහන්සේගෙන් ඊළඟ ප්‍රශ්නය ඇසුවාහුය. ඇවැත්නි යම් ක්‍රමයකින් ආර්‍ය්‍ය ශ්‍රවක තෙම සම්‍යක්දෘෂ්ටි ඇත්තේ වෙයිද දෘෂ්ටිය ඍජුබවට පැමිණියාවෙයිද ධර්මයෙහි නොසෙල්වෙන ප්‍රසාදයෙන් යුක්තවූයේද, මේ (නිර්වාණ) ධර්යට පැමිණියේ වෙයිද, එබඳුවූ වෙනත් ක්‍රමයකුත් ඇත්තේද?

17. ඇවැත්නි ඇත්තේය, ඇවැත්නි යම් තැනක පටන් ආර්‍ය්‍යශ්‍රාවක තෙම වේදනාවත් දනීද, වේදනා නැතිකිරීමට පමුණුවන ප්‍රතිපදාවත් දනීද, ඇවැත්නි වෙපමණකින්ද ආර්‍ය්‍යශ්‍රාවක තෙම සම්‍යක් දෘෂ්ටි ඇත්තේවෙයි. ඔහුගේ දෘෂ්ටිය ඍජුබවට පැමිණියා වෙයි. ධර්මයෙහි නොසෙල්වෙන ප්‍රසාදයෙන් යුක්ත වූයේ ධර්මයට පැමිණියේ වෙයි.

ඇවැත්නි, වේදනාව කවරේද? වේදනාවගේ හටගැන්ම කවරේද? වේදනාව නැතිකිරීම කවරේද? වේදනාවනැතිකිරීමට යන ප්‍රතිපදාව කවරේද? ඇවැත්නි, මේ වේදනාව කොටස් සයක් වෙත්. ඇස හා ගැටීමෙන් හටගන්නා වේදනාවය. කණ හා ගැටීමෙන් හටගන්නා වේදනාවය. නාසය හා ගැටීමෙන් හටගන්නා වේදනාවය. දිව හා ගැටීමෙන් හටගන්නා වේදනාවය. ශරීරය හා ගැටීමෙන් හටගන්නා වේදනාවය. හිත හා ගැටීමෙන් හටගන්නා වේදනාවය. ( යන සයය) ස්පර්ශය (අරමුණු ගැටීම) හෙතුකොටගෙන වේදනාව හටගැන්ම වේ. ස්පර්ශය නැතිකිරීමෙන් වේදනාව නැතිකිරීම වේ. මේ ආර්‍ය්‍ය අෂ්ටාංගික මාර්ගයම වේදනාව නැති කිරීමට පමුණුවන ප්‍රතිපදාවයි. එනම් නිවැරදි දැකිම, නිවැරදි කල්පනාව, නිවැරදි වචනය , නිවැරදි කර්මය, නිවැරදි ජීවිකාව, නිවැරදි ව්‍යායාමය, නිවැරදි සිහිය, නිවැරදි සමාධිය යන මෙයයි.

ඇවැත්නි, යම් තැනක පටන් ආර්‍ය්‍යශ්‍රාවක තෙම මෙසේ වේදනාව දනීද, මෙසේ වේදනාවගේ හටගැන්ම දනීද මෙසේ වේදනාව නැතිකිරීම දනීද, මෙසේ වේදනාව නැති කිරීමට පමුණුවන ප්‍රතිපදාව දනීද, හෙතෙම සර්වප්‍රකාරයෙන් රාගය දුරුකොට ක්‍රොධය දුරුකොට, මම වෙමියි යන

දෘෂ්ටිය හා මානය නසා අවිද්‍යාව දුරුකේට අර්හත්මාර්ගවිද්‍යාව උපදවා මේ ආත්මයෙහිම දුක් කෙළවර කරන්නේ වෙයි ඇවැත්නි, මෙපමණ කින්ද ආර්‍ය්‍යශ්‍රාවකතෙම සම්‍යක්දෘෂ්ටි ැරත්තෙත් වෙයි . ධරමයෙහි නොසෙල්වෙන ප්‍රසාදයෙන් යුක්ත වූයේ මේ (නිර්වාණ) ධර්‍මයට පැමිණයේ වෙයි.

ඇවැත්නි, මැනවැයි කියා ඒ භික්ෂූහු ආයුෂ්මත් ශාරාබපුත්‍ර ස්ථවිරයන් වහන්සේගේ වචනය සතුටින් පිළිගෙන ආයුෂ්මත් ශාරිපුත්‍ර ස්ථවිරයන් වහන්සේගෙන් ඊළඟ ප්‍රශ්නය ඇසුවාහුය.

ඇවැත්නි, යම් ක්‍රමයකින් ආර්‍ය්‍යශ්‍රාවකතෙම සම්‍යක් දෘෂ්ටි ඇත්තෙත් වෙයිද ඔහුගේ දෘෂ්ටිය ඍජුබවට පැමිණියා වෙයිද, ධර්‍මයෙහිනොසෙල්වෙන ප්‍රසාදයෙන් යුකක්ත වූයේ මේ (නිර්‍වාණ) ධර්‍මයට පැමිණියේ වෙයිද, එබඳුවූ වෙනත් ක්‍රමයකුත් ඇත්තේද?

ඇවැත්නි යම් තැනැතක පටන් ආර්‍ය්‍යශ්‍රාවක තෙම මෙසේ ස්පර්‍ශය දනීද, මෙසේ ස්පර්‍ශය හටගැන්ම දනීද ස්පර්‍ශය නැතිකිරීමදනීද, ස්පර්‍ශය නැති කිරීමට පමුණුවන ප්‍රතිපදාව දනීද, ඇවැත්නි, මෙපමණකින්ද ආර්‍ය්‍යශ්‍රාවකතෙම සම්‍යක්දෘෂ්ටිඇත්තේ වෙයි.

ඔහු දෘෂ්ටිය ඍජුබවටපැමිණියා වෙයි . ධර්‍මයෙහි නොසෙල්වෙන ප්‍රසාදයෙන් යුක්තවූයේ වෙයි (නිර්‍වාණ) ධරමයට පැමිණයේ වෙයි.

18. ඇවැත්නි ස්පර්‍ශය කවරේද? ස්පර්‍ශයාගේ හට ගැන්ම කවරේද? ස්පර්‍ශය නැතිකිරීම කවරේද? ස්පර්‍ශය නැතිකිරීමට පමුණුවන ප්‍රතතිපදාව කවරේද? ඇවැත්නි, මේ ස්පර්‍ශ කොටස් සයක් වෙත් .ඇස හා ස්පර්‍ශය කණ හා ස්පර්‍ශය, නාසය හා ස්පර්‍ශය, දිව හා ස්පර්‍ශය ශරිරය හා ස්පර්‍ශය, හිත හා ස්පර්‍ශය, යන සයයි. ආයතන (ඇස,ආදි ඉන්‍ද්‍රිය හය) හටගැන්මෙන් ස්පර්‍ශයන්ගේ නැතිකිරීම වේ. මේ ආර්‍ය්‍යඅෂ්ටාංගික මාර්‍ගයම ස්පර්‍ශය ඇතිකිරීමට පමුණුවන ප්‍රතිපදාවය. එනම් නිවැරදි දැකීමය, නිවැරදි ජීවිකාව, නිවැරදි සිහිය , නිවැරදි සමාධිය යන මෙයි.

ඇවැත්නි, යම් තැනැතක පටන් ආය්‍යයයය්‍යාර්‍ය්‍යශ්‍රාවක තෙම මෙසේ ස්පර්‍ශය දනීද, මෙසේ ස්පර්‍ශය හටගැන්ම දනීද ස්පර්‍ශනැතිකිරීම දනීද, ස්පර්‍ශය නැතිකිරීමට පමුණුවන ප්‍රතිපදාවය. එනම් නිවැරදි දැකීමය, නිවැරදි කල්පනාවය, නිවැරදි වචනය, නිවැරදි කර්‍මාක්තය, නිවැරදි ජීවිකාව, නිවැරදි සිහිය, නිවැරදි සමාධිය යන මෙයයි.

ඇවැත්නි, යම් තැනක පටන් ආර්‍ය්‍යශ්‍රාවක තෙම මෙසේ ස්පර්‍ශය දනීද, මෙසේ ස්පර්‍ශය හටගැන්ම දනීදද, ස්පර්‍ශය නැතිකිරීම දනීද, ස්පර්‍ශය නැතිකිරීමට පමුණුවන ප්‍රතිපදාව දනීද, හෙතෙම සර්‍වප්‍රකාරයෙන් රාගය දුරුකොට ක්‍රොධය දුරුකොට, මම වෙමි යන දෘෂ්ටය හා මානය නසා අවිද්‍යාව දුරුකොට, අර්හත්මාර්‍ග විද්‍යාව උපදවා මේ ආත්මයෙහි දුක්කෙළවර කරන්නේවෙයි. ඇවැත්නි මෙපමනකින්ද ආර්‍ය්‍යශ්‍රාවක තෙමසම්‍යක්දෘෂ්ටි ඇත්තේ වෙයි. ඔහුගේ වෘෂ්ටිය ඍජුබවටපැමිණියා වෙයි. ධර්‍මයෙහි නොසෙල්වෙන ප්‍රසාදයෙන් යුක්ත වූයේ ධර්‍මයට පැමිණියේ වෙයි.

ඇවැත්නි, මැනවැයි කියා ඒ භික්ෂූහු ආයුෂ්මත් ශාරිපුත්‍ර ස්ථවිරයන් වහන්සේගේ වචනය සතුටින් පිළිගෙන ආයුෂ්මත් ශාරිපුත්‍ර ස්ථවිරයන්වහන්සේගෙන් ඊළග ප්‍රශ්නය විචාළාහුය. ඇවැත්නි, යම් ක්‍රමයකින් ආර්‍ය්‍ය ශ්‍රාවක තෙම සම්‍යක්දෘෂ්ටි ඇත්තේවෙයි ද? දෘෂ්ටිය ඍජුබවට පැමිණියාවෙයිද? ධර්‍මයෙහි නොසෙල්වෙන ප්‍රසාදයෙන් යුක්ත වූයේ මේ ධර්‍මයට පැමිණියේ, එබඳු වූ වෙනත් ක්‍රමයකුත් ඇත්තේද?

19. ඇවැත්නි, ඇත්තේය. ඇවැත්නි, යම් තැනක පටන් ආර්‍ය්‍යශ්‍රාවකතෙම ආයතන දනීද, ආයතනයන්ගේ හටගැන්ම දනීද ආයතන නැතිකිරීම දනීද, ආයතන නැතිකිරීමට යන ප්‍රතිපදාව දනීද, ඇවැත්නි, මෙපමණකින්ද ආර්‍ය්‍යශ්‍රාවක තෙමසම්‍යදෘෂ්ටි ඇත්තේ වෙයි. ඔහුගේ දෘෂ්ටිය ඍජුබවට පැමිණියා වෙයි . ධර්‍මයෙහි නොසෙල්වෙන ප්‍රසාද යෙන් යුක්. වූයේ මේ ධර්‍මයට පැමිණියේ වෙයි. ඇවැත්නි, සය ආයතන කවරේද? සය ආයතනයන්ගේ හටගැන්ම කවරේද? සය ආයතනයන්ගේ නැතිකිරීමට යන ප්‍රතිපදාව කවරේද? ඇවැත්නි, මේ ආයතන සයක් වෙත් , චක්ඛු ආයතනය සොත ආයතනය, ඝාණ ආයතනය, ජිව්හා ආයතනය, කාය ආයතනය, මනො ආයතනය, නාම රූපයන්ගෙ' රූප, වේදනා, සඤ්ඤා, සංඛාර, විඤ්ඤාණ, යන ස්කන්ධ හටගැන්මෙන් සය ආයතනයන්ගේ හටගැන්ම වේ. නාමරූපයන් නැතිකිරීමෙන් සය ආයතනයන්ගේ නැතිකිරීම වේ. මේ ආර්‍ය්‍යඅෂ්ටාංගික මාර්‍ගයම සය ආයතනය නැතිකිරීමට පමුණුවන ප්‍රතිපදාවයි. එනම් නිවැරදි දැකීම, නිවැරදි කල්පනාව, නිවැරදි වචනය , නිවැරදි සිහිය, නිවැරදි කර්මාන්තය, නිවැරදි ජීවිකාව, නිවැරදි ව්‍යායාමය, නිවැරදි සමාධිය යන මේයි.

ඇවැත්නි, යම් තැනක පටන් ආර්‍ය්‍යශ්‍රාවකතෙම මෙසේ සය ආයතන දනීද, මෙසේ සය ආයතනයන්ගේ හටගැන්ම දනීද, මෙසේ සය ආයතනයන්ගේ නැතිකිරීම දනීද, මෙසේ සය ආයතනයන්ගේ නැතිකිරීමට යන ප්‍රතිපදාව දනීද, හෙතෙම සර්‍වප්‍රකාරයෙන් රාගය දුරුකොට ක්‍රොධය දුරුකොට, මම වෙමියි යන දෘෂ්ටිය හා මානය නසා ආවිද්‍යාව දුරුකොට අර්හත් මාර්‍ගවිද්‍යාව උපදවා මේ ආත්මයෙහිම දුක් කෙළවර කරන්නේ වෙයි.

ඇවැත්නි මෙපමණකින්ද, ආර්‍ය්‍යශ්‍රාවකතෙම සම්‍යක් දෘෂ්ටිඇත්තේ වෙයි . ඔහුගේ දෘෂ්ටිය ඍජුබවට පැමිණියාවෙයි. ධර්‍මයෙහි නොසෙල්වෙන ප්‍රසාදයෙන් සුක්තවූයේ ධර්‍මයට පැමිණියේ වෙයි.

ඇවැත්නි, ඉතා මැනවැයි, කියා ඒ භික්ඛුහු ආයුෂ්මත් ශාරිපුත්‍ර ස්ථවිරයන් වහන්සේගෙන් ඊළග ප්‍රශ්නය ඇසුවාහුය. ඇවැත්නි යම් ක්‍රමයකින් ආර්‍ය්‍යශ්‍රාවක තෙම සම්‍යක්දෘෂ්ටි ඇත්තේ වෙයි. ඔහුගේ දෘෂ්ටිය ඍජුබවට පැමිණියා වෙයි. ධරමයෙහි නොසෙල්වෙන ප්‍රසාදයෙන් යුක්තවූයේ මේ (නිර්‍වාණ) ධරමයට පැමිණියේ වෙයිද? එබඳු වූ වෙනත් ක්‍රමයක් ඇත්තේ ද?

20. ඇවැත්නි, ඇත්තේය ඇවත්නි යම් තැන පටන් ආර්‍ය්‍යශ්‍රාවක තෙම නාම රූප දෙක දනිද, නාම රූප හට ගැනිම දනිද, නාම රූප හට ගැනිම දනිද නාම රූපයන් නැති කිරිමේ ප්‍රතිපදව දනිද, ඇවත්නි මෙපමණකින් ආර්‍ය්‍යශ්‍රාවක තෙම සම්‍යක් දෘෂ්ටි ඇත්තේ වෙයි. ඔහුගේ දෘෂ්ටිය

ඍජුබවට පැමිණියා වෙයි. ධර්මයෙහි නොසෙල් වෙන ප්‍රසාදයෙන් යුක්ත වූයේ ධර්මයට පැමිණියේ වෙයි.

ඇවැත්නි, නාමරූප කවරේද? නාමරූපයන්ගේ හට ගැන්ම කවරේද? නාමරූපයන්ගේ නැතිකිරීම කවරේද? නාමරූප නැතිකිරීමට යන ප්‍රතිපදාව කවරේද? වේදනය, සංඥාය, චේතනාය, ස්පර්ශය, මනසිකාරය, යන මේ ධර්‍ම ඇවැත්නි. නාමයයි කියනු ලැබේ.

මහා භූත රූප හතර ද ඒ සතරමහා භූතයන් නිසා පවත්නාවූ උපාදාය රූපද යන මෙය ඇවැත්නි රූපයයි කියවු ලැබේ. මෙසේ මේ නාමයද මේ රූපයද –

ඇවැත්නි, නාමරූපයයි කියවු ලැබේ.ප්‍රතිසන්ධිවිඥානයාගේ හටගැන්මෙන් නාමරූපයන්ගේ හටගැන්ම වේ.විඥානය නැතිකිරීමෙන් නාමරූපයන්ගේ නැතිකිරීමවේ. මේ ආර්‍ය්‍ය අෂ්ටාංගික මාර්ගයම නාමරූපයන් නැතිකිරීමේ ප්‍රතිපදාවයි. එනම් නිවැරදි දැකීම , නිවැරදි කල්පනාව , නිවැරදි වචනය, නිවැරදි කර්‍මාන්තය, නිවැරදි ජීවිකාවය, නිවැරදි ව්‍යායාමය, නිවැරදි සිහිය, නිවැරදි සමාධිය යන මේයි.

"ඇවැත්නි, යම් තැනක පටන් ආර්‍ය්‍යශ්‍රාවකතෙම මෙසේ නාමරූපයන් දනීද, මෙසේ නාමරූපයන් දනීද, මෙසේ නාමරූපයන්ගේ හටගැන්ම දනීද, මෙසේ නාමරූපයන්ගේ නැතිකිරීම දනීද, මෙසේ නාමරූපයන්ගේ නැතිකිරීමේ ප්‍රතිපදාව දනීද, හෙතෙම සර්‍වප්‍රකාරයෙන්ම රාගය දුරුකොට ක්‍රොධය දුරුකොට මම වෙමියි යන දෘෂ්ටිය හා මානය නිසා අවිද්‍යාව දුරුකොට අර්හත්මාර්ග විද්‍යාව උපදවා මේ ආත්මයෙහිම දුක් කෙළවර කරන්නේ වෙයි.

ඇවැත්නි, මෙපමණකින්ද ආර්‍ය්‍යශ්‍රාවකතෙම සම්‍යක් දෘෂ්ටි ඇත්තේ වෙයි. ඔහුගේ දෘෂ්ටිය ඍජුබවට පැමිණියා වෙයි. ධර්‍මයෙහි නොසෙල්වෙන ප්‍රසාදයෙන් යුක්ත වූයේ ධර්‍මයට පැමිණියේ වෙයි.

ඇවැත්නි, මැනවැයි ඒ භික්ෂූහු ආයුෂ්මත් ශාරිපුත්‍ර ස්ථවිරයන් වහන්සේගේ වචනය සතුටින් පිළිගෙන ආයුෂ්මත් ශාරිපුත්‍ර ස්ථවිරයන් වහන්සේගෙන් ඊළඟ ප්‍රශ්නය ඇසුවාහුය.

ඇවැත්නි, යම්ක්‍රමයකින් ආර්‍ය්‍යශ්‍රාවකතෙම සම්‍යක්දෘෂටි ඇත්තේ වේද? දෘෂ්ටිය ඍජුබවට පැවිණියා වෙයිද, ධර්‍මයෙහි නොසෙල්වෙන ප්‍රසාදයෙන් යුක්තවූයේ මේ (නිර්‍වාණ) ධර්‍මයට පැමිණියේ වෙයිද, එබඳුවූ වෙනත් ක්‍රමයකුත් ඇත්තේද?

21. ඇවැත්නි ඇත්තේය. ඇවැත්නි, යම්තැනක පටන් ආර්‍ය්‍යශ්‍රාවකතෙම විඤ්ඤාණය දනීද? විඤ්ඤාණයාගේ හටගැන්ම දනීද? විඤ්ඤාණයාගේ නැතිකිරීම දනීද? විඥානයනැතිකිරීමට යන ප්‍රතිපදාව දනීද? විඤ්ඤාණයාගේ නැතිකීම දනීද? විඥානය නැතිකිරීමට යන ප්‍රතිපදාව දනීද? ඇවැත්නි, මෙපමමණකින්ද ආර්‍ය්‍යශ්‍රාවකතෙම සම්‍යක්දෘෂ්ටි ඇත්තේ වෙයි.

ඔහුගේ දෘෂ්ටිය ඍජුබවට පැමිණියා වෙයි. ධර්‍මයෙහි නොසෙල්වෙන ප්‍රසාදයෙන් යුක්ත වූයේ ධර්‍මයට පැමිණියේ වෙයි.

ඇවැත්නි, විඤ්ඤාණයාගේ හටගැන්ම කවරේද? විඤ්ඤාණයාගේ නැතිකිරීම කවරේද? විඤ්ඤාණය නැතිකිරීමේ ප්‍රතිපදාව කවරේද? ඇවැත්නි, මේ විඤ්ඤාණය කොටස් සයකි.

චක්ඛු විඤ්ඤාණය, සොත විඤ්ඤාණය, ඝාණ විඤ්ඤාණය, ජිව්හා විඤ්ඤාණය, කාය විඤ්ඤාණය, මනො විඤ්ඤාණය, සංස්කාරයන්ගේ හටගැන්මෙන් විඤ්ඤාණයන්ගේ හටගැන්මවේ. සංස්කාරයන්ගේ නැතිකිරීමෙන් විඤ්ඤාණයාගේ නැතිකිරීමවේ. මේ ආර්‍ය්‍යඅෂ්ටාංගික මාර්‍ගයම විඤ්ඤාණය නැතිකිරීමේ ප්‍රතිපදාවයි. එනම් නිවැරදි දැකීම, නිවැරදි කල්පනාවය, නිවැරදි වචනය, නිවැරදි කර්‍මාන්තය, නිවැරදි ජීවිකාවය, නිවැරදි ව්‍යායාමය, නිවැරදි සිහිය, නිවැරදි සමාධිය යන මේයි. ඇවැත්නි, යම්තැනක පටන් ආර්‍ය්‍යශ්‍රාවක තෙම මෙසේ විඤ්ඤාණය දනීද, විඤ්ඤාණයාගේ හටගැන්ම දනීද, විඤ්ඤාණය නැතිකිරීම දනීද , විඤ්ඤාණය නැතිකිරීමේ ප්‍රතිපදාව දනීද, හෙතෙම සර්‍වප්‍රකාරයෙන් රාගය දුරු කොට, ක්‍රොධය දුරුකොට, මම වෙමියි. යන දෘෂ්ටිය හා මානය නසා අවිද්‍යාවදුරුකොට අරහත් මාර්‍ග විද්‍යාව උපදවා මේ ආත්මයෙහිම දුක් කෙළවර කරන්නේ වෙයි . ඇවැත්නි, මෙපමණකින්ද ආර්‍ය්‍යශ්‍රාවකතෙම සම්‍යක්දෘෂ්ටි ඇත්තේවෙයි. ඔහුගේ දෘෂ්ටිය ඍජුබවට පැමිණියා වෙයි. ධර්‍මයෙහි නොසෙල්වෙන ප්‍රසාදයෙන් යුක්ත වූයේ ධර්‍මයට පැමිණියේ වෙයි.

ඇවැත්නි, මැනවයි කියා ඒ භික්ෂූහු ආයුෂ්මත් ශාරිපුත්‍ර ස්ථවිරයන්වහන්සේගේ වචනය පිළිගෙන ආයුෂ්මත්ශාරිපුත්‍ර ස්ථවිරයන්වහන්සේගෙන් ඊළඟප්‍රශ්නය ඇසුවාහුය, ඇවැත්නි, යම් ක්‍රමයකින්ආර්‍ය්‍යශ්‍රාවකතෙම සම්‍යක්දෘෂ්ටිඇත්තේ වෙයිද, ඔහුගේ දෘෂ්ටිය ඍජුබවට පැමිණියා වෙයිද, ධර්‍මයෙහි නොසෙල්වෙන ප්‍රසාදයෙන් යුක්තවූයේ මේ ධර්‍මයට පැමිණියේ වෙයිද එබඳුවූ වෙනත් ක්‍රමයකුත් ඇත්තේද?.

**22.** "ඇවැත්නි ඇත්තේය. ඇවැත්නි යම්තැනක පටන් ආර්‍ය්‍යශ්‍රාවකතෙම සංස්කාරයන් දනීද, සංස්කාරයන්ගේ හටගැන්ම දනීද, සංස්කාරයන්ගේ නැතිකිරීම දනීද, සංස්කාරයන්ගේ නැතිකිරීම දනීද, සංස්කාරයන්ගේ නැතිකිරීමේ ප්‍රතිපදාව දනීද, මෙපමණකින්ද ආර්‍ය්‍යශ්‍රාවකතෙම සම්‍යක්දෘෂ්ටි ඇත්තේවෙයි. ඔහුගේ දෘෂ්ටිය ඍජුබවට පැවිණියාවෙයි. ධර්‍මයෙහි නොසෙල්වෙන ප්‍රසාදයෙන් යුක්තවූයේ ධර්‍මයට පැමිණියේ වෙයි.

ඇවැත්නි, සංස්කාරකවරේද? සංස්කාරයන්ගේ හටගැන්ම කවරේද? සංස්කාරයන්ගේ නැතිකිරීම කවරේද? සංස්කාරයන්ගේ නැතිකිරීමේ ප්‍රතිපදාව කවරේද? ඇවැත්නි, මේ සංස්කාරයෝ තිදෙනෙක් වෙත්. කාය සංඛාරය, වචී සංඛාරය, මනෝ සංඛාරය, යන තුනයි. අවිද්‍යාව ගේ හට ගැන්මෙන් සංස්කාරයන්ගේ හටගැන්මවේ. අවිද්‍යාව නැතිකිරීමෙන් සංස්කාරයන්ගේ නැතිකිරීම වේ. ප්‍රතිපදාවයි. එනම් නිවැරදි දැකීම, නිවැරදි කල්පනාව, නිවැරදි වචනය, නිවැරදි කරමාන්තය, නිවැරදි ජීවිකාව, නිවරුදි ව්‍යායාමය, නිවැරදි සිහිය, නිවැරදි සමාධිය, යන මේයි.

ඇවැත්නි, යම් තැනක පටන් ආර්‍ය්‍යශ්‍රාවකතෙම මෙසේ සංස්කාරයන් දනීද, මෙසේ සංස්කාරයන්ගේ හට ගැන්ම දනීද, මෙසේ සංස්කාරයන්ගේ නැති කිරිම දනීද, මෙසේ

සංස්කාරයන්ගේ නැති කිරීමේ ප්‍රතිපදාව දනිද හෙතම සර්වප්‍රකාරයෙන් රාගය දුරු කොට ක්‍රොධය දුරු කොට මම වෙමියි යන දෘෂ්ටිය හා මානය නිසා අවිද්‍යාව දුරු කොට අර්හත් මර්ග විද්‍යාව උපදවා මේ ආත්මයෙහිම දුක් කෙළවර කරන්නේ වෙයි.

ඇවත්ති, මෙපමණකින් ද, ආර්‍ය්‍යශ්‍රාවකතෙම සම්‍යක් දෘෂ්ටි ඇත්තේ වෙයි, ඔහුගේ දෘෂ්ටිය ඍජු බවට පැමිණියා වෙයි. ධර්මයෙහි නොසෙල්වෙන ප්‍රසාදයෙන් යුක්තවූයේ ධර්මයට පැමිණියේ වෙයි.

ඇවැත්ති, මැනවැයි කියා ඒ භික්ෂූන ආයුෂ්මත් ශාරිපුත්‍ර ස්ථවිරයන් වහන්සේගේ වචනය සතුටින් පිළිගෙන ආයුෂ්මත් ශාරිපුත්‍ර ස්ථවිරයන් වහන්සේගෙන් ඊළග ප්‍රශ්නය ඇසුවාහුය. ඇවැත්ති, යම් ක්‍රමයකින් ආර්‍ය්‍යශ්‍රාවකතෙම සම්‍යක්දෘෂ්ටි ඇත්තේ වෙයිද? ඔහුගේ දෘෂ්ටිය ඍජු බවට පැමිණියා වෙයිද, ධර්මයෙහි නොසෙල්මෙන ප්‍රසාදයෙන් යුක්ත වූයේ මේ (නිර්වාණ) ධර්මයට පැමිණියේ වෙයිද, එබඳු වෙනත් ක්‍රමයකුත් ඇත්තේද?

**23.** ඇවැත්ති, ඇත්තේය. ඇවැත්ති, යම් තැනක පටන් ආර්‍ය්‍යශ්‍රාවකතෙම අවිද්‍යාවත් දනිද, අවිද්‍යාව නැති කිරිවත් දනිද, අවිද්‍යාව නැතිකිරීමේ ප්‍රතිපදාවත් දනිද, මෙපමණකින්ද ආර්‍ය්‍යශ්‍රාවකතෙම සමශක්දෘෂ්ටි ඇත්තේ වේ. ඔහුගේ දෘෂ්ටිය ඍජු බවට පැමිණියා වෙයි. නොසෙල්වෙන ප්‍රසාදයෙන් යුක්ත වූයේ ධර්මයට පැමිණියේ වෙයිද?

ඇවැත්ති, අවිද්‍යාව කවරේද? අවිද්‍යාවට හේතුව කවරේද? අවිද්‍යාව නැති කිරීම කවරේද? අවිද්‍යාව නැති කිරීමේ ප්‍රතිපදාව කවරේද?

ඇවැත්ති, දුක පිළිබඳ යම් නොදැන්මක් වේද, දුක හට ගැනිමට හේතුව පිළිබඳව යම් නොදැන්මක් වේද, දුක නැති කිරීමේ ප්‍රතිපදාව පිළිබඳව යම් නොදැනුමක් වේද, ඇවැත්ති මේ නොදැන්ම අවිද්‍යාවයයි කියනු ලැබේ. ආශ්‍රවයන් (බොහෝ කල් සිට පැවත එන කෙලෙස්) හෙතු කොටගෙන අවිද්‍යාවගේ හට ගැන්ම වේ. ආශ්‍රවයන් නැතිකිරීමෙන් අවිද්‍යාව නැතිවේ. මේ ආර්‍ය්‍ය අෂ්ටාඞ්ගික මාර්ගයම අවිද්‍යාව නැති කිරීමේ ප්‍රතිපදාවයි. එනම් නිවැරදි දැකිම, නිවැරදි කල්පනාව, නිවැරදි වචනය, නිවැරදි කර්මාන්තය, නිවැරදි ජිවිකාව, නිවැරදි ව්‍යායාමය, නිවැරදි සිහිය, නිවැරදි සමාධිය යන මේයි.

ඇවැත්ති, යම් තැනක පටන් ආර්‍ය්‍යශ්‍රාවකතෙම මෙසේ අවිද්‍යාවට හේතුව දනීද, මෙසේ අවිද්‍යාව නැති කිරීම කිරිම දනිද, මෙසේ අවිද්‍යාව නැති කිරීමේ ප්‍රතිපදාව දනිද, හෙතෙම සර්වප්‍රකාරයෙන් රාගය දුරුකොට ක්‍රොධය දුරු කොට මම වෙමියි යන දෘෂ්ටිය හා මානය නිසා අවිද්‍යාව දුරු කොට අරහත් මාර්ග විද්‍යාව උපදවා මේ ආත්මයෙහිම දුක් කෙළවර කරන්නේ වෙයි. ඇවැත්ති, මෙපමණකින්ද ආර්‍ය්‍යශ්‍රාවක තෙම සම්‍යක්දෘෂ්ටි ඇත්තේ වෙයි. ඔහුගේ දෘෂ්ටිය ඍජු බවට පැමිණියා වෙයි. ධර්මයෙහි නොසෙල්වෙන ප්‍රසාදයෙන් යුක්තවූයේ ධර්මයට පැමිණියේ වෙයි.

ඇවැත්ති, මැනවැයි ඒ භික්ෂූහු ආයුෂ්මත් ශාරිපුත්‍ර ස්ථවිරයන් වහන්සේගේ වචනය සතුටින් පිළිගෙන ආයුෂ්වත් ශාරිපුත්‍ර ස්ථවිරයන් වහන්සේගෙන් ඊළග ප්‍රශ්නය ඇසුවාහුය.

ඇවැත්නි, යම් ක්‍රමයකින් ආර්‍ය්‍යශ්‍රාවකතෙම සම්‍යක් දෘෂ්ටි ඇත්තේ වෙයිද, දෘෂ්ටිය ඍජු බවට පැමිණියා වෙයිද, ධර්‍මයෙහි නොසෙල්වෙන ප්‍රසාදයෙන් යුක්තවූයේ මේ (නිර්වන ධර්‍මයට පැමිණියේ වෙයිද, එබඳු වෙනත් ක්‍රමයකුත් ඇත්තේද?.

24. ඇවැත්නි, ඇත්තේය, ඇවත්නි, යම් තැනක පටන් ආර්‍ය්‍යශ්‍රාවක තෙම ආශ්‍රවයන් (බෝහෝ කල් සිට පැවත එන කෙලෙස්) දනිද, ආශ්‍රවයන්ට හේතුවත් දනිද, ආශ්‍රවයන්ගේ නැතිකිරීමත් දනිද, ආශ්‍රවයන් නැතිකිරීමේ ප්‍රතිපදාවත් දනිද, ඇවැත්නි, මෙපමණකින්ද, ආර්‍ය්‍යශ්‍රාවකතෙම සම්‍යක්දෘෂ්ටි ඇත්තේ වෙයි. ඔහුගේ දෘෂ්ටිය ඍජු බවට පැමිණියා වෙයි. ධර්‍මයෙහි නොසෙල්වෙන ප්‍රසාදයෙන් යුක්තවූයේ ධර්‍මයට පැමිණියේ වෙයි.

ඇවත්නි, ආශ්‍රවයෝ කවරහුද? ආශ්‍රවයන්ට හෙතුව කවරේද? ආශ්‍රවයන් නැතිකිරීම කවරේද? ආශ්‍රවයන් නැතිකරණ ප්‍රතිපදාව කවරේද? ඇවැත්නි, මේ ආශ්‍රව තුනක් වෙත්. කාමශ්‍රවය (කාම තණ්හාව), භවාශ්‍රවය(භව තණ්හාවය), අවිද්‍යාශ්‍රවය (මොහය) යන තුනයි. අවිද්‍යාව හේතු කොට ගෙන ආශ්‍රවයන්ගේ හට ගැන්ම වේ. අවිද්‍යාව නැති කිරීමෙන් ආශ්‍රවයන්ගේ නැති කිරීම වේ. මේ ආර්‍ය්‍ය අෂ්ටාඞ්ගික මාර්‍ගයම ආශ්‍රවයන් නැතිකිරීමේ ප්‍රතිපදාව වෙයි.

එනම් නිවැරදි නිවැරදි දැකිම, නිවැරදි කල්පනාව, නිවැරදි වචනය, නිවැරදි කර්‍මාන්තය, නිවැරදි ජිවිකාව, නිවැරදි ව්‍යායාමය, නිවැරදි සිහිය, නිවැරදි සමාධිය, යන මෙයි.

ඇවැත්නි, යම් තැනක පටන් ආර්‍ය්‍යශ්‍රාවකතෙම මෙසේ ආශ්‍රවයන් දනිද, ආශ්‍රවයන්ගේ හට ගැන්මත් දනිද, ආශ්‍රව නැතිකිරීමත් දනිද, ආශ්‍රව නැතිකිරීමේ ප්‍රතිපදාව දනිද, හෙතම සර්‍වප්‍රකාරයෙන් රාගය දුරු කොට ක්‍රොධය දුරු කොට මම වෙමියි යන දෘෂ්ටිය හා මානය නිසා අවිද්‍යාව දුරුකොට අර්හත් මාර්‍ග විද්‍යාව උපදවා මේ ආත්මයෙහි දුක් කෙළවර කරන්නේ වෙයි.

ඇවත්නි, මෙපමණකින්ද ආර්‍ය්‍යශ්‍රාවක තෙමේ සම්‍යක් දෘෂ්ටි ඇත්තේ වෙයි. ඔහුගේ දෘෂ්ටිය ඍජුබවට පැමිණියා වෙයි. ධර්මයහි නොසෙල්වෙන ප්‍රසාදයෙන් යුක්තවූයේ ධර්‍මයට පැමිණියා වෙයි.

ආයුෂ්මත් ශාරිපුත්‍ර ස්ථවිරයන් වහන්සේ මේ ධර්‍මය වදාළහ. සතුටු සිත් ඇත්තාවූ ඒ භික්ෂූහු ආයුෂ්මත් ශාරිපුත්‍ර ස්ථවිරයන් වහන්සේගේ වචනය ඉතා සතුටින් පිළිගත්තාහුය.

**නව වැනි වූ සම්මා දිට්ඨි සූත්‍රය නිමි.**